සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2018

# ඉස්ලාම් ධර්මය

**9 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

**නම/ විභාග අංකය:**

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- වඩාත්ම සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 මූසා නබිතුමා ඉපදුණු තැන
(i) ගාසා (ii) මදීනා (iii) ඊජිප්තුව (iv) පලස්තීනය

02 නබි ෂුඅයිබ් (අලෛ) ගේ දූවරුන්ගෙන් එක්කෙනෙක්ව විවාහ කරගත් නබිතුමා
(i) ඊසා (අලෛ) (ii) හාරූන් (අලෛ) (iii) දාවූද් (අලෛ) (iv) මූසා (අලෛ)

03 ඊසා (අලෛ) තුමාට පසුව නබිවරයෙකු ලෙස පත්වූයේ,
(i) ඊබ්‍රාහිම් (අලෛ) (ii) මුහම්මද් (සල්) තුමා
(iii) මූසා (අලෛ) (iv) ඉස්මායිල් (අලෛ)

04 ''උම්මුල් මසාකීන්'' කියා අමතනු ලබන කාන්තාවක වන්නේ,
(i) සෙයිනබ් බින්ත් ජහ්ෂ් (රළි) (ii) සෙයිනබ් බින්ත් හුසෙමා (රළි)
(iii) ආයිෂා (රළි) (iv) මයිමූනා (රළි)

05 කොන්ස්තන්තිනෝපලය ජයගත් වීරයා
(i) මුහම්මද් අල් ෆාතිහ් (ii) සලාහුද්දීන් අයියූබි
(iii) සුල්තාන් මුහම්මද් (iv) ඉමාමුද්දීන් සන්කී

06 මූසා (අලෛ) තුමා නබිවරයා ලෙස තෝරාගනු ලැබූ තැන
(i) හිරා ගුහාව (ii) තූර්සිනා කන්ද (iii) සෆා කන්ද (iv) උහද් කන්ද

07 මදීනා සාසනය සිද්ධ වූ වර්ෂය
(i) ක්‍රි.ව. 650 (ii) ක්‍රි.ව. 570 (iii) ක්‍රි.ව. 622 (iv) ක්‍රි.ව. 600

08 උමර් (රළි) තුමාගේ පාලන සමයේදී ඊජිප්තුවේ ආණ්ඩුකාරවරයා ලෙස සිටියේ,
(i) අබ්බාස් (රළි) (ii) අම්රු බින් ආස් (රළි)
(iii) මුආවියා (රළි) (iv) අලි (රළි)

09 ''තක්වා'' නැමති අරාබි වචනයේ අර්ථය වන්නේ,
(i) භය භක්තිය (ii) සමාව අයැදීම (iii) පිළිගැනීම (iv) භාරගැනීම

10 මක්කම ජයගත් වර්ෂය
(i) හිජ්රි 06 (ii) හිජ්රි 10 (iii) හිජ්රි 08 (iv) හිජ්රි 11

11 ෂිර්ක්කයෙහි යෙදෙන්නන්
(i) මුනාෆික් (ii) කාෆිර් (iii) මුර්තද් (iv) මුෂ්රික්

12 නබි (සල්) තුමාණන්ගේ භාර්යාවක ලෙස සිටි අබූසුෆ්යාන්ගේ දුව
(i) උම්මු සල්මා (රළි) (ii) අයිෂා (රළි)
(iii) උම්මු හබීබා (රළි) (iv) මයිමූනා (රළි)

13 ''දිගු අත් ඇත්තිය'' කියා නබිතුමා සඳහන් කළ කාන්තාව

(i) මයිමූනා (රළි) (ii) සෙයිනබ් බින්තු ජහ්ෂ් (රළි)

(iii) ආයිෂා (රළි) (iv) සව්දා (රළි)

14 නබි (සල්) තුමාගේ අවසාන භාර්යාව

(i) මයිමූනා (රළි) (ii) සව්දා (රළි) (iii) කදීජා (රළි) (iv) ආයිෂා (රළි)

15 මූසා (අලෛ) තුමාට ප්‍රදානය කරන ලද බලයක් වන්නේ,

(i) අත් දිළිසීම (ii) රෝග සුව කිරීම

(iii) සුළඟ වශී වීම (iv) මළවුන් නැවත මැවීම

16 ෆිර්අවුන්ගේ රජමාළිගාවේ බිසව ආසියා ළඟ වැඩුණු දරුවා

(i) ඊසා (අලෛ) (ii) හාරූන් (අලෛ) (iii) යූසුෆ් (අලෛ) (iv) මූසා (අලෛ)

17 නබි (සල්) තුමා අභාවප්‍රාප්ත වූ මාසය

(i) රබීඋල් අව්වල් (ii) රබීඋල් ආහිර් (iii) ෂව්වාල් (iv) රමළාන්

18 ''ඒක දේවවාදය'' යන අර්ථය සඳහන් කරවන අරාබි පදය

(i) මආද් (ii) තව්හීද්

(iii) රිසාලත් (iv) නුබුව්වත්

19 ''තර්තීබුත් තිලාවත්'' යනු

(i) රාවිවරුන්ගේ අනුපිළිවෙළ (ii) පාරායණය කරන ක්‍රමවේද

(iii) පහළ කළ ක්‍රමවේද (iv) ලියන ලද ක්‍රමවේද

20 හාරූන් (අලෛ) තුමාගේ සහෝදරයා

(i) ශීද් (අලෛ) (ii) ඉද්රීස් (අලෛ) (iii) මූසා (අලෛ) (iv) ඊසා (අලෛ)

21 මූසා (අලෛ) ජන්මයයි. ෆිර්අවින්ගෙන් ආරක්ෂා වූ විධිය ගැන කියැවෙන සූරාව

(i) සූරා නූහ් (ii) සූරා අන්ආම් (iii) සූරා නූර් (iv) සූරා අල්කසස්

22 ෆිර්ආවින්ගේ සත්‍යය නම

(i) දෙවන රාම්සිස් (ii) පළමු රාම්සිස් (iii) හාමාන් (iv) උබෛ

23 නබි (සල්) තුමාගේ කාලයේ ඇබිසීනියාව පාලනය කළ රජතුමා

(i) වලීද් (ii) නජ්ජාසි (iii) හාරූන් අල් රෂීද් (iv) අක්බර්

24 නබි (සල්) තුමාණන් හජ් යුතුකම ඉටුකිරීම යන මොහොතේදී මදීනාවට භාරව පත්වූ සහාබිවරයා

(i) අබූ තුජානා (රළි) (ii) ඉක්රිමා (රළි)

(iii) උමර් (රළි) (iv) අලි (රළි)

25 හජ් ක්‍රියාවන් ඉටුකරනවිට ජම්රාවලට ගල් විසිකිරීමේ දිනයන්

(i) දුල්හජ් මස සඳ 9, 10, 11 (ii) දුල්හජ් මස සඳ 11, 12, 13

(iii) දුල්හජ් මස සඳ 10, 11 (iv) දුල්හජ් මස සඳ 8, 9, 10

- **අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට පහත සඳහන් වචන ගළපා හිස්තැන් පුරවන්න.**

(ආර්මිනියා / සූරා ලුහා / ඉමාම් මුස්ලිම් / උහද් / ඉමාම් නවවි රහ්)

26 සහීහ් මුස්ලිම් ග්‍රන්ථයට විවරණ ග්‍රන්ථය වූ අල්මින් හාජ් ග්‍රන්ථයේ කතුවරයා ..............................................

27 නබි (සල්) තුමාණන් සහභාගි වූ යුද්ධයන් අතරින් එකක් ..............................................

28 ''විරුදාවලිය'' නොමැතිව තමන්ගේම නමින් අමතනු ලබන ඉමාම්වරයා ..............................................

29 නබි (සල්) තුමාණන්ට සැනසිම සඳහා පහළවූ සූරාව ..............................................

30 කලීෆා උස්මාන් (රළි) තුමාගේ පාලනයේ ඇතිවූ යුද්ධයක් වන්නේ ..............................................

- **අංක 31 - 35 දක්වා වූ ප්‍රශ්න හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

31 මුහම්මද් අල් ෆාතිහ් තමාගේ 19 වැනි වයසේදී උස්මානිය පරිපාලනයේ වගකීම භාරගත්තේ ය. (      )

32 නාස්තිය පවක් නැත. (      )

33 හලාල්, හරාම් කුමක්ද කියා තීරණය කරන බලය මිනිසාට ඇත. (      )

34 සමාජ අතර නීතිය රැකගැනීම අවශ්‍ය වේ. (      )

35 සියලු මැවීම් අල්ලාහ් තආලාගේ පවුලකි. (      )

- **අංක 36 - 40 දක්වා ඇති ප්‍රශ්නවලට A කොටසින් ගැළපෙන වැකි B කොටසට යා කරන්න.**

| | A කොටස | | B කොටස |
|---|---|---|---|
| 36 | 3 වන කලීෆා | • | ඉබ්නු බතූතා |
| 37 | මක්කාවෙහි ඇති බැවුම් වලින් එකකි | • | උස්මාන් (රළි) |
| 38 | දේශ සංචාරකයා | • | බිලාල් (රළි) |
| 39 | කුරෙෂි නායකවරුන්ගෙන් කෙනෙකි | • | ඉත්කිර් |
| 40 | ප්‍රථමවරට අදාන් කියා සලාතයට කැඳවූයේ | • | අබූ සුෆ්යාන් |

(ලකුණු 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(1) ඊසා (අලෛ) තුමාණන්ට දෙන ලද බලයන් දෙකක් ලියන්න.

(2) ආගම් පහළ වූ නබිවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(3) මුහම්මද් අල් ෆාතිහ් කොටුව අත්පත් කරගැනීමට භාවිතා කළ ජලාශ්‍රිතය කුමක් ද?

(4) අද ඉස්තන්බූල් කියා අමතනු ලබන නගරයේ පැරණි නම කුමක් ද?

(5) හැසිරීම් සම්බන්ධව තිබෙන හරාම්වලින් දෙකක් ලියන්න.

(6) මුස්ලිම්වරුන්ගේ ශුද්ධ ස්ථාන දෙකක නම් ලියන්න.

(7) නාස්තිය වැළැක්වීමට හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

(8) අජ්නබි, මහ්රම් යනු කුමක් ද?

(9) ක්‍රිස්තියානින්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය කුමක් ද?

(10) දේශාභිමානය එළිදැක්විය හැකි ක්‍රියාමාර්ග දෙකක් ලියන්න. (ලකුණු 20)

02 (1) උම්මහාතුල් මුඃමිනීන් යනුවෙන් අමතන ලද්දෝ කවුරුන් ද?

(2) ඔවුන්ගෙන් තුන්දෙනෙකුගේ නම් ලියන්න.

(3) ඉස්ලාමය ජය ගැනීමට ඔවුන්ගෙන් ලැබුණු සහයෝග හතරක් ලියන්න. (ලකුණු $3+3+4=10$)

03 (1) ඉතිරි කිරීමෙන් ලැබෙන වාසි තුනක් ලියන්න.

(2) පිරිමැසීම යනු කුමක් ද?

(3) යූසුෆ් නබි තුමාගේ පාලන සමයේ දී ඇතිවූ ආහාර හිඟයට එතුමා ගත් පියවර කුමක්ද කියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු $3+3+4=10$)

04 (1) හලාල්, හරාම් යන පද විස්තර කරන්න.

(2) ඔබ ජීවත්වන පරිසරයේ හරාම් වූ ක්‍රියාවන් තුනක් ලියන්න.

(3) අල්ලාහ්තආලා හරාම් කියලා තහනම් කළ ඒවායින් පහත දැක්වෙන ඒවාට උදාහරණ දෙක බැගින් ලියන්න.

(i) ඇඳුම් සම්බන්ධව

(ii) අන් අයගේ අයිතීන් සම්බන්ධව (ලකුණු $3+3+4=10$)

05 (1) මුහම්මද් අල් ෆාතිහ් ඉස්තන්බූලය ජයගත් පසු සමාජය අමතා කළ දේශනාවෙන් වැදගත් කරුණු තුනක් ලියන්න.

(2) මුහම්මද් අල් ෆාතිහ්ගේ ගුරුතුමාගේ නම කුමක් ද?

(3) එතුමා විසින් තම ශිෂ්‍යයන්ට (විටින් විට) නැවත නැවත මතක් කරන හදීසයක් ලියන්න.

(ලකුණු $3+3+4=10$)

06 (1) ශ්‍රී ලංකා ජනතාව අනුගමනය කරන ආගම් තුනක් ලියන්න.

(2) බුදුරජාණන් වහන්සේ දුටු ශෝකවන්ත සිද්ධීන් තුන කුමක් ද?

(3) හින්දු ආගමේ ආධාරක ග්‍රන්ථ වන ආගම් සතර කුමක් ද? (ලකුණු $3+3+4=10$)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 3 | (02) | 4 | (03) | 2 | (04) | 2 | (05) | 1 | (06) | 2 | (07) | 3 | (08) | 2 |
| (09) | 1 | (10) | 3 | (11) | 4 | (12) | 3 | (13) | 2 | (14) | 1 | (15) | 1 | (16) | 4 |
| (17) | 1 | (18) | 2 | (19) | 2 | (20) | 3 | (21) | 4 | (22) | 1 | (23) | 2 | (24) | 1 |
| (25) | 2 | (26) | ඉමාම් නවවි (රහු) | (27) | උහද් | (28) | මුස්ලිම් | (29) | සුරතුල් ලුහා | (30) | අර්මීනියා | | | | |
| (31) | ✓ | (32) | × | (33) | × | (34) | ✓ | (35) | ✓ | (36) | උස්මාන් (රළි) | (37) | ඉද්කිර් | | |
| (38) | ඉබ්නු බතුතා | (39) | අබු සුෆ්යාන් | (40) | බිලාල් (රළි) | | | | | | | | | | |

## II කොටස

01 (1) මළවුන් පණගැන්වීම / කුෂ්ඨ රෝගීන් සුව කිරීම / නිවසේ සඟවා තිබෙන බඩු කුමක් ද කියා නිවැරදිව කීම

(2) දාවුද් මූසා (අලෛ) / ඊසා (අලෛ) / මුහම්මද් (සල්)

(3) අල්කර්නුස්සහාබි

(4) කොන්ස්තන්තිනෝබලය

(5) දුරාචාරය, සොරකම් කිරීම

(6) මස්ජිදුල් හරාම් / මස්ජිදුන් නබවි / මස්ජිදුල් අක්ෂා

(7) වැඩිපුර දැල්වෙන බල්බ, විදුලි පංකා යනාදිය නිවා දැමීම / වතු ගලමින් තිබෙන ජල කරාමය තදින් වැසීම / කෝප්පයට (පාත්තරයට) වතුර අරන් බීම

(8) විවාහ කර ගැනීම අනුමැතිය ලද්දෝ - අජ්නබි / විවාහ කර ගැනීම අනුමැතිය නොලද්දෝ - මහ්රම්

(9) ශුද්ධ වූ විවිලිය

(10) රටේ ජනතාවට ආදරය දක්වන්න ඕනෑ. ඔවුන් සමග ඔවුන්ගේ සුබසෙත පතා අන්‍යෝන්‍යයව ජීවත් විය යුතුය. රටේ දියුණුවට දායකත්වය දීම

02 (1) විශ්වාසවන්තයන්ගේ මව්වරු / නබි (සල්) තුමාගේ භාර්යාවරුන්

(2) කදීජා (රළි) / සව්දා (රළි) / ආයිශා (රළි) / සෙයිනබ් බින්ත් ජහ්ෂ් (රළි) / සෙයිනබ් බින්ති හුසෙමා (රළි) / උම්මු හබීබා (රළි) / ජුවෙයිරියා (රළි) / සෆියියා (රළි) / හෆ්සා (රළි) / මයිමූනා (රළි)

(3) නබි (සල්) තුමාණන්ට සේවය කිරීම / එතුමාගේ දේශනාවන්වලට ආදර්ශවත්ව සිටීම / හොඳ අදහස් දීම / එතුමාගෙන් ආගම ගැන ඉගෙනගෙන අන් අයටත් ඉගැන්වීම

03 (1) වැදගත් අවස්ථාවලදී උදව් ලැබීම / මෙය හොඳ ක්‍රියාවකි / අනාගත පරම්පරාවට උදව් වෙයි.

(2) තිබෙන දෙයින් අවශ්‍යතාවය සපුරාගැනීම.

(3) 9 ශ්‍රේණිය ඉස්ලාම් පොතේ පිටු අංක 108 බලන්න.

04 (1) අල්ලාහ්තආලා විසින් අනුමැතිය දී තිබෙන සියල්ල හලාල් වේ. තහනම් කළ සියල්ල හරාම් වේ. හරාම් වූ දේවල් කිරීම අපරාධයක් හා පාප ක්‍රියාවකි.

(2) පොළිය / පගාව / සූදුව

(3) <u>ඇඳුම් සම්බන්ධව</u>

* පිරිමින්ට පටපිළි ඇඳීම / රන් ආභරණ භාවිතය
* පිරිමින් ගැහැණු වගෙනුත් ගැහැණුන් පිරිමි වගෙනුත් ඇඳුම් ඇඳීම
* ඉස්ලාමීය නීතිරීති පිළිනොපැදීම

<u>අන් අයගේ අයිතීන් සම්බන්දව</u>

* සොරකම් කිරීම * නින්දා කිරීම * මැරීම

05 (1)
* කොන්ස්තන්තිනෝපලය ජයගත් වීරයන් බවට පත්විය.
* නබි (සල්) තුමාගේ හදීසය ක්‍රියා කළෙහු
* එතුමාගේ ස්නේහය (සුබ සෝබනය) ලබාගත්තෙහු
* වැඩිමහල් සහාබාවරුන්ගේ හා මුතුන් මිත්තන්ගේ හීනය සැබෑ කරගත්හු

(2) ආක් සම්සුදීන්

(3) කොන්ස්තන්තිනෝපලය වීරයෙක් විසින් අත්පත් කරනු ලබයි. එම සේනාධිපතිතුමා හොඳම සේනාධිපති. එම සේවාන තමා හොඳම සේනාව

06 (1) ඉස්ලාම් / බෞද්ධ / හින්දු / ක්‍රිස්තියානි

(2) මහල්ලෙකු දැකීම / රෝගියෙකු දැකීම / මැරුණු කෙනෙකු දැකීම

(3) ඉරුක්කු / යසූර් / සාමම් / අදර්වම්